# පුරප්පාඩු පිරවීම

# ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ පිළිබඳව වැඩි විස්තර ජාතික අධ්‍යාපන ආයතනයේ www.nie.ac.lk වෙබ් අඩවියේ "News & Events" ඔස්සේ බාගත කරගත හැක.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉහත වෙබ් අඩවියට පිවිසීමෙන් බාගත කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය, තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026 ජූනි 05 දිනට හෝ එම දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් තනතුරක් සඳහා එක් අයදුම්පත්‍රය බැගින් එවිය යුතුය.

## තනතුරු

1. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
2. **නීති නිලධාරී**
3. **කාර්යාල ලේකම්**
4. **භාෂා පරිවර්තක**
5. **පුස්තකාල සහකාර**
6. **විද්‍යාගාර සහකාර**
7. **මාධ්‍ය කාර්මික**
8. **කළමනාකරණ සහකාර**
9. **රියදුරු**
10. **ප්‍රධාන අරක්කැමි**
11. **පරිගණක ග්‍රැෆික් නිර්මාණකරු (කොන්ත්‍රාත් )**
12. **කාර්යාල කාර්ය සහයක (කොන්ත්‍රාත්)**
13. **කම්කරු (කොන්ත්‍රාත්)**

**සැලකිය යුතුයි** - රාජ්‍ය සංස්ථා / මණ්ඩල / දෙපාර්තමේන්තු / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන්නන් තම අයදුම්පත්‍ර ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු ය.

**අයදුම්කරුවන් සඳහා කොන්දේසි**

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය. (කෙසේ වෙතත් ඔබගේ නිත්‍ය සේවා ස්ථානය අංක 21, හයිලෙවල් පාර, මහරගම/ හයිලෙවල් පාර, මීපේ වේ.)
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත්‍රය සමඟ උප්පැන්න සහතිකයේ/ අධ්‍යාපන/ වෘත්තීය සහතික සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමඟ එවිය යුතුය.
- මෙය ස්ථිර තනතුරකි. තෝරාගත් අපේක්ෂකයින් තම වැටුපෙන් 8% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය සේවක අර්ථ සාධක අරමුදල සඳහා 12% ක් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% ක් දායක කරනු ඇත.
- මූලික වැටුපට අමතරව, අනෙකුත් රජයේ අනුමත දීමනා ආයතනය විසින් ගෙවනු ලැබේ.
- අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

රජයේ /රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන්නෙකු නම් ඉහත පරිදි අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශ රහිතව එවන ලද, නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද, අසම්පූර්ණ සහ නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත ඇබෑර්තු පිරවීමේ අවසන් තීරණය ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව සතු වේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**